රුහුණ විශ්වවිද්‍යාලය
ருஹுணு பல்கலைக்கழகம்
UNIVERSITY OF RUHUNA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
தொலை மற்றும் தொடர் கல்வி அலகு
Distance and Continuing Education Unit
වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව வெல்லமடம மாத்தறை 81000 இலங்கை WELLAMADAMA, MATARA 81000 SRI LANKA

මගේ අංකය / எனது எண் / My No. } RU/DCEU/09

ඔබේ අංකය / உங்களது எண் / Your No. }

2024.12.03

**උපාධිලාභීන් වෙතයි**

ස්වාමින්වහන්ස/ මහතමයණෙනි/ මෙනවියනි

## උපාධි ප්‍රදානෝත්සවය - 2024

රුහුණ විශ්වවිද්‍යාලයේ 2024 වර්ෂයේ දී පවත්වනු ලබන උපාධි ප්‍රදානෝත්සවය 2024 දෙසැම්බර් 12 සහ 13 වන දින රුහුණ විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. 2022/2023 අධ්‍යයන වර්ෂයන්හි දී ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිලාභීන් වෙත උපාධි පිරිනැමීම පහත සඳහන් වේලාවට ආරම්භ වීමට නියමිතය.

| | |
|---|---|
| දිනය | : 2024.12.13 |
| සැසි අංකය | : 6 වන සැසිය |
| වේලාව | : ප.ව. 4.30 |

එදින පස්වරු 3.00 ට උපාධිලාභීන්ගේ පෙරහැර ආරම්භ කරන රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය ඉදිරිපිට ඔබ වෙත ලබා දී **අනුක්‍රමික අංකයේ අනුපිළිවෙලට** පෙළ ගැසිය යුතු ය. උපාධිලාභීන්ගේ පෙරහැර ආරම්භ වූවාට පසු පැමිණෙන කිසිවෙකු උපාධි ප්‍රදානෝත්සවය සඳහා උත්සව ශාලාවට ඇතුළත් කර ගනු නො ලැබේ.

### 01. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන ආකාරය

උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ සම්පූර්ණ යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය. කාන්තා උපාධිලාභීන් පෙරදිග සිරිතට අනුව විචිත්‍ර වර්ණයෙන් හා උත්සව විලාශයෙන් සාරියක්/ඔසරියෙන් සැරසී පැමිණිය යුතුය. ඔබ වෙත ලබා දී ඇති අනුක්‍රමික අංකය උපාධි කබායේ වම්පස පැලඳිය යුතු වේ.

### 02. ප්‍රවේශපත් නිකුත් කිරීම

සෑම උපාධිලාභියෙකුටම උපාධි ප්‍රදානෝත්සවය සඳහා අමුත්තන් දෙදෙනෙකුගේ උපරිමයකට යටත්ව කැඳවාගෙන ඒමට හැකිවන පරිදි ප්‍රවේශපත් දෙකක් නිකුත් කිරීමට කටයුතු කරන අතර, උපාධිලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී එම ප්‍රවේශපත් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. එම ප්‍රවේශපත්‍ර හිමි අමුත්තන් සඳහා රබින්ද්‍රනාත්තාගෝර් ශාලාව ඇතුලත උපාධි ප්‍රදානෝත්සවය නැරඹීමට සහභාගීවිය හැක.

## 03. උපාධි ලෝගු හා මාල ආපසු බාර දීම සහ සහතික නිකුත් කිරීම

උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනයේ දී හෝ උපාධි ප්‍රදානෝත්සවය නිම වී සති දෙකක් ඇතුළත උපාධි ලෝගුව, මාලය, හිස්වැසුම සහ අදාළ අයඳුම්පතෙහි ඉතිරි කොටස සමඟ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට බාර දී ලබා ගත යුතු අතර, එම කාලසීමාව ඉකුත් වීමෙන් අනතුරුව ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම දිනකට රු.250/- බැගින් වන ප්‍රමාද ගාස්තුවක් ගෙවිය යුතු වේ. තව ද ඒවා ඔබ බාරයේ තිබියදී යම් අලාභයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම හා ඊට අතිරේකව එම වටිනාකමින් 25%ක ගාස්තුවක් ද ගෙවීමට සිදුවනු ඇත.

## 04. සැලකිය යුතු කරුණු

උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත ඡායාරූප ගැනීම තහනම් වන අතර, උත්සව ශාලාව තුළට කැමරා හා ඡායාරූප උපකරණ හෝ බෑග්, ගමන්මලු, පාර්සල් ආදීය හෝ ජංගම දුරකථන ගෙන යාම ද සම්පූර්ණයෙන් තහනම් බව කරුණාවෙන් සලකන්න.

එමෙන්ම උත්සව ශාලාව තුළට වයස අවුරුදු 12 න් පහළ ළමුන් ඇතුළු කිරීමට ද අවසර නොමැති බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගීවන ලෙසට ඔබට මෙයින් ආරාධනා කරන අතර උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය හුදෙක් ම අපේක්ෂා කරනු ලැබේ.

දුරකථනය தொலைபேசி Telephone
General 041 22 27001-4 Ext. 2155
Director 041 22 23133

ෆැක්ස් பக்ஸ் Fax
041 22 23133

ඊ මේල් மின்னஞ்சல் E-mail
dceu@admin.ruh.ac.lk.

වෙබ් අඩවිය இணையத்தளம் Web
www.ruh.ac.lk